**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – September 2019
**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - සැප්තැම්බර් 2019**

PALI - II / පාලි II - (PLG 2)
**(අනිර්දිෂ්ට ග්‍රන්ථ, ගද්‍ය රචනය හා පාලි ව්‍යාකරණ)**

පළමු වන කොටසෙහි ප්‍රශ්න සියල්ලට ම හා
දෙවන කොටසින් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 07 කි.)

(කාලය පැය තුනයි )

---

## I - කොටස

1. (අ) සිංහලට නගන්න.

''චත්තාරිමානි , ආනන්ද, අධිකරණානි. කතමානි චත්තාරි? විවාදධිකරණං, අනුවාදධිකරණං, ආපත්තාධිකරණං, කිච්චාධිකරණං - ඉමානි ඛො, ආනන්ද, චත්තාරි අධිකරණානි. සත්ත ඛො පනිමෙ, ආනන්ද, අධිකරණසමථා - උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය සම්මුඛාවිනයො දතබ්බො, සතිවිනයො දතබ්බො, අමූළ්හවිනයො දතබ්බො, පටිඤ්ඤාය කාරෙතබ්බං, යෙභුය්‍යසිකා, තස්සපාපියසිකා, තිණවත්ථාරකො.

'කථඤ්චානන්ද, සම්මුඛාවිනයො හොති? ඉධානන්ද, භික්ඛූ විවදන්ති ධම්මොති වා අධම්මොති වා විනයොති වා අවිනයොති වා. තෙහානන්ද, භික්ඛූහි සබ්බෙහෙව සමග්ගෙහි සන්නිපතිතබ්බං. සන්නිපතිත්වා ධම්මනෙත්ති සමනුමජ්ජිතබ්බා . ධම්මනෙත්තිං සමනුමජ්ජිත්වා යථා තත්ථ සමෙති තථා තං අධිකරණං වූපසමෙතබ්බං. එවං ඛො, ආනන්ද, සම්මුඛාවිනයො හොති; එවඤ්ච පනිධෙකච්චානං අධිකරණානං වූපසමො හොති යදිදං - සම්මුඛාවිනයෙන.

'කථඤ්චානන්ද, යෙභුය්‍යසිකා හොති? තෙ චෙ, ආනන්ද, භික්ඛූ න සක්කොන්ති තං අධිකරණං තස්මිං ආවාසෙ වූපසමෙතුං. තෙහානන්ද, භික්ඛූහි යස්මිං ආවාසෙ බහුතරා භික්ඛූ සො ආවාසො ගන්තබ්බො. තත්ථ සබ්බෙහෙව සමග්ගෙහි සන්නිපතිතබ්බං. සන්නිපතිත්වා ධම්මනෙත්ති සමනුමජ්ජිතබ්බා. ධම්මනෙත්තිං සමනුමජ්ජිත්වා යථා තත්ථ සමෙති තථා තං අධිකරණං වූපසමෙතබ්බං. එවං ඛො, ආනන්ද, යෙභුය්‍යසිකා හොති, එවඤ්ච පනිධෙකච්චානං අධිකරණානං වූපසමො හොති යදිදං - යෙභුය්‍යසිකාය.

(ආ) ඉරි ඇඳි පදවලට ව්‍යාකරණ විවරණ සපයන්න.

අනෙක් පිටුවට ...

2. (අ) සිංහලට නගන්න.

''තං <u>නමස්සන්ති</u> තෙවිජ්ජා, සබ්බෙ භුම්මා ච ඛත්තියා;
චත්තාරො ච මහාරාජා, තිදසා ච යසස්සිනො;
අථ කො නාම සො යක්ඛො, යං ත්වංසක්ක නමස්සසී''ති.

''මං නමස්සන්ති තෙවිජ්ජා, සබ්බෙ භුම්මා ච ඛත්තියා;
චත්තාරො ච මහාරාජා, තිදසා ච යසස්සිනො.

''<u>අහඤ්ච</u> සීලසම්පන්නෙ, චිරරත්තසමාහිතෙ;
සම්මාපබ්බජිතෙ වන්දෙ, බ්‍රහ්මචරියපරායනෙ.

''යෙ ගහට්ඨා පුඤ්ඤකරා, සීලවන්තො උපාසකා;
ධම්මෙන දාරං පොසෙන්ති, තෙ නමස්සාමි මාතලී''ති.

''සෙට්ඨා හි කිර ලොකස්මිං, යෙ ත්වංසක්ක නමස්සසි;
අහම්පි තෙ නමස්සාමි, යෙ නමස්සසි වාසවා''ති.

''ඉදං වත්වාන මඝවා, දෙවරාජා සුජම්පති;
පුථුද්දිසා නමස්සිත්වා, පමුඛො රථමාරුහී''ති.

(ආ) ඉරි ඇඳි පදවලට ව්‍යාකරණ විවරණ සපයන්න.

3. පාලියට නගන්න.

එකල්හි මගධරට රජවූ වෛදෙහිපුත්‍ර අජාසත් රජ සිවුරඟ සෙනග සරහා කොසොල් රජුට විරුද්ධව යුද පිණිස කසීරට වෙත ගියේය. පසෙනදි කොසොල් රජද මගධාධිපති අජාසත් රජ සිවුරඟ සෙනග සරසා විරුද්ධව කසීරට වෙත ආයේයයි ඇසීය.

පසෙනදි කොසොල් රජද සිවුරඟ සෙනග සරසාගෙණ අජාසත් රජුට විරුද්ධව සටන් පිණිස කසීරටට ගියේය. ඉන්පසු මගධරට රජවූ වෛදෙහිපුත්‍ර අජාසත් රජද, පසෙනදි කොසොල් රජද යුද්ධ කළාහුය. ඒ යුද්ධයේදී මගධරට රජවූ වෛදෙහිපුත්‍ර අජාසත් රජ පසෙනදි කොසොල් රජුන් පැරදවීය. පැරදී පසෙනදි කොසොල් රජ සිය රාජධානියවූ සැවැත් නුවරට පසුබැස ගියේය.

එකල බොහෝ භික්ෂූහු පෙරවරු කාලයෙහි හැඳ පොරවා, පාත්‍ර සිවුරු ගෙණ සැවැත් නුවරට වැඩ පසුබත් කල්හි පිණ්ඩපාතයෙන් පෙරළා ආවාහු භාග්‍යවතුන් වහන්සෙ යම් තැනකද, එතැනට පැමිණියෝය. පැමිණ, වැඳ, එකපසව හිඳ භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ. ''ස්වාමීනි, මෙහි මගධරට රජවූ වෛදෙහිපුත්‍ර අජාසත් රජ සිවුරඟ සෙනග සරසාගෙන පසෙනදි කොසොල් රජුට විරුද්ධව සටන් පිණිස කසීරටට ගියේය. පසෙනදි කොසොල් රජද මගධරට වෛදෙහිපුත්‍ර අජාසත් රජ සිවුරඟ සෙනග සරසාගෙන මට විරුද්ධව යුධ පිණිස කසීරටට ආවේයයි' ඇසීය. ඉක්බිති පසේනදි කොසොල් රජද සිවුරඟ සෙනග සරසාගෙන මගධරට රජවූ වෛදෙහිපුත්‍ර අජාසත් රජුට විරුද්ධව යුද පිණිස කසීරටට ගියේය. ඒ දෙදෙන එහි යුද කළහ. ඒ යුදෙහි මගධරට රජවූ වෛදෙහිපුත්‍ර අජාසත් රජ පසෙනදි කොසොල් රජ පැරදවීය. ස්වාමීනි, පැරදුනාවූ පසෙනදි කොසොල් රජ සිය රාජධානියවූ සැවැත් නුවරට පසුබැස ආවේය.'' යනුයි.

අනෙක් පිටුවට ...

## II - කොටස

4. පාලි භාෂාවේ තද්ධිත හඳුන්වා එහි ප්‍රයෝජන පැහැදිලි කරන්න.

5. පාලි භාෂාවේ කම්මධාර සමාසයෙහි විවිධ ප්‍රයෝග නිදසුන් සහිතව විස්තර කරන්න.

6. 'භූ' ධාතුව අජ්ජතනී අත්තනොපද හා පරස්සපදයෙහි වරනඟන්න.

7. පහත දැක්වෙන මාතෘකාවලින් දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

   I. තද්ධිත
   II. උපසග්ග
   III. නාම විභත්ති
   IV. නිපාත
   V. කාරක

==========